# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,356 - 2023 ඔක්තෝබර් මස 27 වැනි සිකුරාදා - 2023.10.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 586 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 නොවැම්බර් මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 නොවැම්බර් මස 03 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

## කොළඹ දී පවත්වනු ලබන (සිවිල් අධිකරණ බලය මෙහෙයවන) බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

2007 අංක 07 දරන සමාගම් පනතේ 270 (අ) උපවගන්තිය සමග කියවිය යුතු වූ 272 (1) වගන්තිය යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

හිටිහාමිල්ලාගේ ශ්‍යාම් ප්‍රසන්න පතිරාජ,
අංක 394/1,
එකමුතු මාවත,
තලංගම උතුර, බත්තරමුල්ල.

නඩු අංකය : CHC/41/2023 CO.
ස්වභාවය : සමාගම්
කාර්ය පටිපාටිය : ලඝු

*..................පෙත්සම්කරු.*

*එදිරිව*

ඒ. බේස් මැච්ෆාම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(A Base Mechfarms (Private Limited)
අංක 62, ප්‍රධාන පාර,
බත්තරමුල්ල.

*...................වග උත්තරකරු.*

ඉහත නම සඳහන් සමාගම ඈවර කිරීම සඳහා වර්ෂ 2023ක් වූ ජුනි මස 15 වැනි දිනැති පෙත්සමක් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ ඉහත නම සඳහන් පෙත්සම්කරු වෙනුවෙන් රොස්මීඩ් ලෝ චේම්බර්ස් නීතිඥ සමාගම විසින් ඉදිරිපත් කරනු ලැබ, ඒ පිළිබඳ වර්ෂ 2023ක් වූ නොවැම්බර් මස 03 වැනි දින එකී අධිකරණයේ දී විමසීමට නියම කර ඇති අතර, ඒ පිළිබඳ එකී සමාගමේ ණය හිමියෙකු හෝ සහදායකයෙකු හෝ එකී පෙත්සමේ මතු නියෝගයන් දීමේ දී ඉල්ලීමට මනාපය හෝ විරුද්ධ ප්‍රකාශ කිරීමට කැමැත්තෙහි නම්, එවැනි යම් ණය හිමියෙකු හෝ සහදායකයෙකු විසින් පුද්ගලිකව පෙනී සිට හෝ නීතිඥයෙකු මගින් ඒ සඳහා පෙනී සිටිය යුතු වන අතර, එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ සහදායකයෙකු හට පෙත්සමේ පිටපත් නියමිත ගාස්තු ගෙවීමෙන් පසු පහත ලිපිනයෙන් ලබාගත හැකිය.

රොස්මීඩ් ලෝ චේම්බර්ස්,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 18, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 07.

**සටහන.**- යම් පුද්ගලයෙකු එකී පෙත්සම පිළිබඳ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන්නේ නම්, ඒ බව නීතිඥ සමාගම වෙත ලිඛිතව දැන්වීම භාරදීමෙන් හෝ තැපැල් මගින් හෝ දන්වා සිටිය යුතු අතර, එම දැන්වීමේ යම් පුද්ගලයෙකු නම්, නම සහ ලිපිනය ද, ආයතනයක් නම් ආයතනයේ නම සහ ලිපිනය ද දක්වා පුද්ගලයා විසින් හෝ ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයා (සිටී නම්) විසින් අත්සන් තබා භාරදිය යුතු අතර, තැපෑලෙන් එවන්නේ නම් අවශ්‍ය කාලසීමාව ඇතිව වර්ෂ 2023ක් වූ නොවැම්බර් මස 02 වැනි දින ප.ව. 6.00 ට පෙර ඉහත නම සඳහන් නීතිඥ සමාගම වෙත භාරදිය යුතු බව ද දන්වා සිටිමු.

10-459

## පාර්ලිමේන්තුව

### වැල්ලවත්ත වයිඑම්බීඒ සොසයිටිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

මධුර විතානගේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ "වැල්ලවත්ත වයිඑම්බීඒ සොසයිටිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

*(අ)* බුද්ධ ධර්මය නගා සිටුවීම, එහි අධ්‍යයනය සහ ව්‍යාප්තිය සඳහා පහසුකම් සැලසීම ;

*(ආ)* බුද්ධ ධර්මය පිළිපැදීම ධෛර්යය කිරීම ; සහ

*(ඇ)* බෞද්ධයන් අතර සමගිය හා සහයෝගය වැඩි දියුණු කිරීම ;

යනාදිය වේ.

නීතිඥ මධුර විතානගේ,<br>
පාර්ලිමේන්තු මන්ත්‍රී,<br>
කොළඹ දිස්ත්‍රික්කය.

10-378